# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2339/02 - 2023 ජූලි මස 03 වැනි සඳුදා - 2023.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත (420 වන අධිකාරය)**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවෙහි (2) වන අනු ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතෙහි (420 වැනි අධිකාරය) 34 වන වගන්තිය සමඟ කියවිය යුතු 55 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් සකස් කරන ලද නියෝග.

රනිල් වික්‍රමසිංහ,<br>
ජනාධිපති සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ<br>
ජාතික ප්‍රතිපත්ති විෂයය භාර අමාත්‍යවරයා.

2023 ජූලි මස 03 වැනි දින,<br>
කොළඹ දී ය.

2023 ජුනි මස 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (ජනරජය) පාර්ලිමේන්තුව විසින්, රාජ්‍ය ණය තිරසාරභාවය සහතික කිරීම සඳහා ජනරජයේ දේශීය රාජ්‍ය ණය ප්‍රශස්තකරණය සිදුවිය යුතු බවට සම්මත කරන ලද අතර, ඒ තුළින් රාජ්‍ය ණය තිරසරභාවය සහතික කිරීම සමඟින් ආර්ථිකය කඩිනමින් යථා තත්ත්වයට පත්කිරීම හරහා, ශ්‍රී ලංකාවේ ජනතාවට සහ අනාගත පරම්පරාවන්ට ප්‍රතිලාභ ගෙන දෙන තිරසාර ආර්ථික වර්ධනයක් සුරක්ෂිත කිරීම වෙනුවෙන්, දේශීය රාජ්‍ය ණය ප්‍රශස්තකරණය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සියලු අනුමැතිය ලබාදෙන ලදී.

1937 අංක 07 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ 34 වන වගන්තිය සමඟින් කියවිය යුතු 55 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති විෂයය භාර අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, පහත සඳහන් රෙගුලාසි සම්පාදනය කරමි.

1A - G 39807 — 356 (2023/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## නියෝග

1. මෙම නියෝග ''2023 අංක 2 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (සුරැකුම්පත් පරිවර්තන) නියෝග'' ලෙස දැක්විය හැකිය.

2. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය ලේකම් හා රාජ්‍ය ණය අධිකාරී වෙත මෙම ක්‍රියාමාර්ග සඳහා මම අවශ්‍ය බලය පවරමි.

    2.1 මෙම ආඥාපනත යටතේ හෝ වෙනත් ඕනෑම පනතක විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව තුළ නිකුත් කර ඇති ස්කන්ධ හෝ සුරැකුම්පත් හිමියෙකුට 2023 ජුනි මස 28 වැනි දින වන විට පවතින ස්කන්ධ හෝ සුරැකුම්පත් මුළුමනින්ම හෝ ඉන් කොටසක් පරිවර්තනය කිරීමට හෝ හුවමාරු කිරීමට, අදාළ පරිදි, අවස්ථාව පිරිනැමීමට,

    2.2 මෙම ආඥාපනත යටතේ හෝ වෙනත් ඕනෑම පනතක විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව තුළ නිකුත් කර ඇති ඕනෑම ස්කන්ධ හෝ සුරැකුම්පත් හිමියෙකුට එම ස්කන්ධ හෝ සුරැකුම්පත්, අදාළ පරිදි, භාණ්ඩාගාර බැඳුම්කරවලට පරිවර්තනය කිරීම හෝ හුවමාරු කිරීමට,

    2.3 මෙම ආඥාපනත යටතේ එම භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පොලී ගෙවීම සහ පරිවර්තනය හෝ හුවමාරු කිරීම සඳහා වන ක්‍රමවේදය අදාළ පරිදි සඳහන් කිරීමට,

3. ඉහත රෙගුලාසි 2 යටතේ ප්‍රකාශයට පත්කරන ලද සහ බලය පවරන ලද පරිදි, පරිවර්තනය කිරීම හෝ හුවමාරු කිරීම සඳහා අවශ්‍ය වන භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයක් මෙම ආඥාපනත යටතේ සකස් කර නිකුත් කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් සහ රාජ්‍ය ණය අධිකාරී වෙත මම මෙයින් බලය පවරමි.

4. සුරැකුම්පත් පරිවර්තනය හෝ හුවමාරු කිරීමේදී, අදාළ පරිදි, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඕනෑම ලිඛිත නීතියක් අනුව, ඕනෑම ස්කන්ධ හෝ සුරැකුම්පත්වලට අදාළ වන සියලු වරප්‍රසාද, නිදහස් කිරීම් සහ ප්‍රතිලාභ මෙම ආඥාපනත යටතේ නිකුත් කරන ලද ඕනෑම නව ලියාපදිංචි ස්කන්ධ හෝ සුරැකුම්පත්වලට ද අදාළ වන බව මෙයින් මම ප්‍රකාශ කරමි.

5. මෙම රෙගුලාසි මඟින් බලය පවරා දී ඇති ආකාරයට, භාණ්ඩාගාර බැඳුම්කර සකස් කිරීමේදී හා නිකුත් කිරීමේදී, දරන ලද ඕනෑම වියදමක් ගෙවීම සඳහා මෙම ආඥාපනත යටතේ, අදාළ පරිදි, භාණ්ඩාගාර බැඳුම්කර සකස් කිරීම සහ නිකුත් කිරීමේ බලය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් සහ රාජ්‍ය ණය අධිකාරී වෙත මම මෙයින් බලය පවරමි.

EOG - 07-0001

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.